# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/7 - 2016 මාර්තු මස 28 වැනි සඳුදා - 2016.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය : එම්ඕආර්/එල්ඒඑන්/01/එෆ්අයි/202
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/06/2014/එච්ඩබ්/310

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරටුවැල්ල උතුර (මොරටුව මහ නගර සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේ ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති 2016. 01.25 දිනැති කැඩැස්තර සිතියම් අංක 520214, කලාප අංක 03 සහ පත්‍ර අංක 06 දරන පිඹුරේ කැබලි අංක 209 සිට 210 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0243 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (02):

01. **කැබලි අංක 209**
ඉඩමේ නම: වරි. අංක 02 (කොටසක්), පරණ ගාලු පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: – සඳහන් නොවේ; ප්‍රමාණය: හෙක්. 0.0107.

02. **කැබලි අංක 210**
ඉඩමේ නම: වරි. අංක 02 (කොටසක්), පරණ ගාලු පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: හේවා දේවගේ සයිමන් ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0136.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2016 මැයි මස 11 වැනි දින පෙරවරු 9.30 ට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 මැයි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ලියකියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

කේ. සී. නිරෝෂන්,
ප්‍රාදේශීය ලේකම්,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2016 මාර්තු මස 21 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මොරටුව.

04 - 546


1A - G 23207- 21 (2016/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.